# සුචරිතවාදී සමාජ ක්‍රමයක් බිහිකිරීමෙහි ලා පොහොය ටෙලිනාට්‍ය මඟින් සිදු කෙරෙන ආගමික සන්නිවේදනය (තෝරාගත් ටෙලිනාට්‍ය ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයකි)

ඒ.එම්.ටී.ඩී. අබේසිංහ[1]

## හැඳින්වීම

බහු මාධ්‍ය සන්දර්භය තුළ ආගමික සන්නිවේදනය යන්න වඩා ජනප්‍රිය වූත්, විෂයක් වශයෙන් වර්ධනය වෙමින් පවතින්නා වූත් ආනුෂංගික ප්‍රවාහයකි. මුද්‍රිත, විද්‍යුත් සහ සමාජ මාධ්‍ය යන සියල්ලෙහි විවිධ අන්තර්ගතයන් ඔස්සේ ආගමික සන්නිවේදන කාර්යය ඉටු කෙරෙනු පෙනේ. බහු සංස්කෘතික, බහු ආගමික රාජ්‍යයක ආගමික සන්නිවේදනයේ බහුවිධ සන්නිවේදන අන්තර්ගතයන් හඳුනාගත හැකි ය. බෞද්ධ ආගම මූලික කොටගෙන මෙම අධ්‍යයනය සිදු කෙරෙන අතර, එහි දී රූපවාහිනී මාධ්‍ය කෙරෙහි විශේෂ අවධානය යොමු කොට ඇත.

"ධර්ම සන්නිවේදනය'' යනු ධර්මය දේශනා කිරීම ය. මෙහි සන්නිවේදකයා යනු ධර්මදේශකයා ය. ධර්ම සන්නිවේදනයේ ඉතිහාසය බුද්ධ කාලය දක්වා හෙවත් වසර දෙදහස් හයසිය දක්වා ම දිවෙයි. ප්‍රථම බෞද්ධ ධර්ම සන්නිවේදක කණ්ඩායම වශයෙන් වාර්තා වෙන්නේ පස්වග මහණුන් හා යස තෙරුන් ඇතුළු පනස් පස් නමක් වූ රහතන් වහන්සේලා ය. (ඉනාමළුවේ ශ්‍රී සුමංගල නාහිමි, 2020, පි.112)

අතීතයේ ධර්ම සන්නිවේදන ක්‍රියාවලියෙහි ප්‍රධාන ධාරා කිහිපයක් දැකිය හැකි ය.

01. ඍජු ධර්ම කරුණු සන්නිවේදනය (ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා)

02. ධර්මාදර්ශ පසක් කරවන වින්දනාත්මක සන්නිවේදනය (ධර්ම සාහිත්‍යය, ආගමික නාට්‍ය)

මෙයට අමතරව බිතු සිතුවම්, කැටයම්, නෙළීම්, ඇඹීම් යන ව්‍යවහාර විධි ඔස්සේ ද ධර්ම සන්නිවේදනයෙහි සැලකිය යුතු කාර්ය භාර්යක් ඉටු කර ඇත.

සුචරිතවාදී සමාජයක් යනු සදාචාරාත්මක වටිනාකම් සුරක්ෂා කරන ලද අන්‍යෝන්‍ය ගෞරවය හා යහපැවැත්ම සහතික කරන ලද ගිහියා විසින් පිළිපැදිය යුතු බෞද්ධ දර්ශනය මූලික කොට නිර්මාණය වූ සාධාරණ සමාජ ක්‍රමයකි. මෙවන් සමාජ ක්‍රමයක් පවත්වාගෙන යාමෙහි ලා ජනමාධ්‍ය මඟින් සිදු කෙරෙන සන්නිවේදන කාර්යය කෙබඳු දැයි විමසුමට පාත්‍ර කිරීම වඩාත් කාලෝචිත වේ.

1 මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, ශ්‍රී ලංකාව. deepthika@ssh.rjt.ac.lk

"බුද්ධ ධර්මයේ එන චතුරාර්ය සත්‍යය, ආර්ය අෂ්ටාංගික මාර්ගය වැනි ප්‍රධාන ඉගැන්වීම් අනුව නිගමනය වන්නේ ලෝක සත්වයා සාංසාරික දුකින් මුදා ඔහු නිසි මග යොදවා ස්ථිර සැනසිල්ලකට පත් කිරීම බෞද්ධ ආගමික නිෂ්ටාව වන බව ය. මෙය නිවන නමින් ද හැඳින්වෙයි. වෙනත් ඕනෑ ම දෙයක් සම්බන්ධයෙන් මෙන් ම සන්නිවේදනය සම්බන්ධයෙන් ද බෞද්ධ යැයි වෙන්කොට දැක්විය හැකි යම් සුවිශේෂ ලක්ෂණයක් වෙතොත් එය ද ඉහත දක්වන ලද ආගමික නිෂ්ටාව වන නිවන් මඟට පුද්ගලයා මෙහෙය වන මාර්ගයට ගැලපෙන්නක් විය යුතු ය." (ගුණසිංහ, 2025)

ජනමාධ්‍ය මූලික කොටගත් ආගමික සන්නිවේදනයේ ආරම්භක පියවර මුද්‍රිත මාධ්‍ය ඔස්සේ සිදු වූ අතර ක්‍රමිකව විද්‍යුත් මාධ්‍ය ආගමනයෙන් පසු පිළිවෙළින් ගුවන්විදුලිය සහ රූපවාහිනිය එහි ප්‍රමුඛ කාර්යයක් ඉටු කරනු දැකිය හැකි ය.

ජනමාධ්‍ය අන්තර්ගතය තුළ ආගමික සන්නිවේදන කාර්යය ඉටු කරන විවිධ මාධ්‍ය ආකෘති හඳුනාගත හැකි ය. මෙහි දී ටෙලි නාට්‍ය නැමති රූපවාහිනී වැඩසටහන් ආකෘතිය ඔස්සේ සිදු කෙරෙන ආගමික සන්නිවේදනය සුචරිතවාදී සමාජයක් ගොඩනැගීමෙහි ලා පූර්වගාමී වන්නේ කෙසේ ද යන පර්යේෂණ ගැටලුව මූලික කොට ගනිමින් අධ්‍යයනය සිදු කර ඇත.

"ටෙලි නාට්‍ය යනු සංස්කෘතික භාණ්ඩයකි. සංස්කෘතික භාණ්ඩයක් වශයෙන් ටෙලි නාට්‍යයක වෙනත් භාණ්ඩවල අන්තර්ගත නොවන විවිධ අදහස්-උදහස්, මතවාද, ආකල්ප, සංකේතීය අර්ථ මෙන් ම දෘෂ්ටිවාදයන් ද ගැබ් වේ. ටෙලි නාට්‍ය කලා කෘතියක් වශයෙන් සලකන කල්හි එහි කලාත්මක ගුණාංග මෙන් ම සෞන්දර්යාත්මක සංකල්ප ගැන ද විමසා බැලීමට සිදු වේ. ටෙලි නාට්‍යයක ප්‍රමිතිය තීරණය වන්නේ ආකෘතික සුන්දරත්වය මෙන් ම, අන්තර්ගතයේ හරවත් බව හා අර්ථවත් බව අනුව ය. (බෝගමුව, 2014, පි. 106-107)

ආගම හා සම්බන්ධ දර්ශනයන් මෙන් ම මතවාද ප්‍රචාරය කිරීම, සදාචාරාත්මක එළඹුම් කෙරෙහි පුද්ගලයා හා සමාජය මෙහෙය වීම, සමාජ යහපැවැත්ම ගොඩනැගීම, පුද්ගලයා අධ්‍යාත්මික සංවර්ධනය කෙරෙහි නැඹුරු කරවීම, ආගමික සහජීවනය ගොඩනැගීම යන ආගමික සන්නිවේදනයේ මූලික අපේක්ෂා අතර පොහොය ටෙලි නාට්‍ය ඔස්සේ නිර්මාණකරුවා පුද්ගලයා හා සමාජය විෂයෙහි දක්වා ඇති දෘෂ්ටිවාදය කවරාකාර ද යන්න මෙහි දි විමසුමට පාත්‍ර කෙරේ.

**අරමුණ**

පොහොය ටෙලි නාට්‍ය ඔස්සේ සිදු කෙරන ආගමික සන්නිවේදනය මගින් සුචරිතවාදී සමාජයක් සඳහා වන එළඹුම් කාරක පිළිබඳ විමසා බැලීම.

**ක්‍රමවේදය**

මෙහි දි 2025 වසරේ ජාතික රූපවාහිනියෙහි විකාශිත සිත නිවන කතා සහ ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශිත සංසාරේ පිය සටහන් යන පොහොය ටෙලි නාට්‍යවලින් නිර්මාණ 06 බැගින් 12ක් අහඹු නියැදීම යටතේ නියැදිය වශයෙන් තෝරා ගැනුණි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ තෝරාගත් නිර්මාණ අන්තර්ගත විෂය විශ්ලේෂණයට බඳුන් කෙරිණි.

වගු අංක 01

**සිත නිවන කතා**

| **විකාශිත මාසය** | **ටෙලි නාට්‍යයේ නම** | **තේමාව** | **චර්යාත්මක ලක්ෂණ** |
|---|---|---|---|
| අප්‍රේල් | බැඳි නොබැඳ | ආදරය ලබා දෙන දෙයක් මිස ලබා ගන්නා දෙයක් නොවේ. | මිනිස් සිතෙහි හටගන්නා හැඟීම්වල ස්වභාවය, ප්‍රමාණය |
| ජූනි | මහණ වීම | ජීවිතයේ වටිනාකම | එළඹ සිටි සිහියෙන් කටයුතු කිරීමෙන් ජීවිතය හරවත් වෙයි. |
| ජූලි | පිං පොත | පරිත්‍යාගය | පරිත්‍යාගය තුළින් ලබන සතුට සහ සැනසිල්ල අපරිමාණ වේ. |
| සැප්තැම්බර් | අත්වාරුව | පව් කරන්නා මෙලොවදීත් තැවෙයි. පරලොවදීත් තැවෙයි. දෙලොවදීම තැවෙයි. මා විසින් පවක් කරන ලදැයි සිතා තැවෙයි. ඒ නිසා දුගතියට පත් වුවහොත් වඩාත් තැවෙයි. | පාපයෙන් ගැලවීමක් නොමැත. |
| ඔක්තෝබර් | නැකැත | කාරණය ඉෂ්ට වේ නම් එය ම නැකැත ය. නැකැත් තරුවලට කුමක් කළ හැකි ද? | නොපෙනෙන දේට වඩා පෙනෙන සත්‍ය වැදගත් ය. |
| දෙසැම්බර් | අමතන්න 1818 | මත්ද්‍රව්‍ය ව්‍යසනය තුරන් වූ කලෙක සියලු සිත් සතන් නිවී සැනසෙනු ඇත. | සැනසිලිදායක ජීවිතයක් සඳහා යහපත් චර්යාවක නියැලිය යුතු ය. |

වගු අංක 02

**සංසාරේ පිය සටහන්**

| **විකාශිත මාසය** | **ටෙලි නාට්‍යයේ නම** | **තේමාව** | **චර්යාත්මක ලක්ෂණ** |
|---|---|---|---|
| ජනවාරි | හක්බෙල්ලෙකු සමග | දුර සිට බලන විට ඔබට සත්‍ය නොපෙනේ | මතුපිටින් බලා මිනිසුන්ගේ ගති ලක්ෂණ හා චර්යාවන් නිරීක්ෂණයෙන් සත්‍ය ගම්‍යමාන නොවේ. |
| පෙබරවාරි | මන්ද්‍රි | "චිත්තේන නීයති ලෝකෝ චිත්තේන පරිකස්සති චිත්තස්ස ඒකධම්මස්ස සබ්බේව වසමන්වගුති." "සිත විසින් ලෝක සත්වයා පමුණුවනු ලබයි. සිත විසින් ඔබ මොබ අදිනු ලබයි. සිත නමැති එක ම ධර්මයකට සියලු ලෝක සත්වයෝ වසඟ ව ගියාහුය." | කුසල සහ අකුසල සඳහා සිත මූලික වේ. |
| අප්‍රේල් | මල් | ධර්මය පිළිබඳ මිනිසුන් තුළ පවත්නා වැරදි මතවාද | නිවීම යනු අත්කර ගැනීම නොව අතහැරීම ය. |
| මැයි | ආනිශංස | ලැබිය යුත්තාට යුතු දේ ලැබේ. | බලය, ධනය මත නොව ධර්මයට අනුව ලැබිය යුතු පුද්ගලයාට ලැබිය යුතු වටිනාකම් හිමිවෙයි. |
| ජූලි | පෘථග්ජන | සියලු ක්‍රියාවන් සඳහා සිත මුල් වේ. | සිත මූලික කොටගෙන උපදින සිතිවිලි මත මිනිස් චර්යා ගොඩනැගෙයි. |
| සැප්තැම්බර් | සංසාර පුත්‍ර | සද්භාවයෙන් සිදුකරන යහපත් ක්‍රියාවන්ට තරාතිරම අදාළ නොවේ. | වෘත්තිය තරාතිරම මත සමාජ තත්වයන් තීරණය කළ නොහැකි ය. |

**ප්‍රතිඵල**

- පොහොය ටෙලි නාට්‍ය සඳහා බොහෝ විට නිමිති වන්නේ බුදුන් වදාළ ධර්ම කරුණකි. එය නිමිති කොට ගෙන නාට්‍යානුසාරයෙන් සමකාලීන සමාජයට උචිත පරිදි අන්තර්ගතය ගොඩනැගේ.
- ධර්ම කරුණු තෝරාගැනීමේ දී සමකාලීන සමාජ ගැටලු කෙරෙහි ප්‍රමුඛතාව ලබා දී ඇත.
- නිර්මාණය අවසානයේ සදුපදේශයක් ජනගත කෙරේ.

- කතාවේ අන්තර්ගතය අනුව නරඹන්නා තුළ පහන් සංවේගය ඇති කරන ආකාරයේ සංගීතය, දෙබස් හා උපක්‍රමික හඬහාවිත කෙරේ.
- දීප්තිමත් වර්ණ සංයෝජනයක් සහ තීව්‍ර ආලෝකකරණ ක්‍රමවේද මෙම නාට්‍ය තුළ අවම වශයෙන් භාවිත කොට ඇත.
- බුද්ධ දර්ශනයේ අන්තර්ගත ගැඹුරු ධර්ම කරුණු සන්නිවේදනයත් එමගින් බුද්ධ දර්ශනයට අනුව එහි අග්‍ර ඵලය වන නිවන නම් වන ගමනාන්තය කෙරෙහි ප්‍රේක්ෂකයා මෙහෙයවීමත් පොහොය නාට්‍ය මගින් දැකගත නොහැකි වේ.

**සාකච්ඡාව**

පොහොය ටෙලි නාට්‍ය ඔස්සේ සිදු කෙරෙන්නේ සමාජ ජීවිතය යහපත්ව පවත්වාගෙන යාමෙහි ලා උපදේශනාත්මක සන්නිවේදනයකි. ආගමික සන්නිවේදනය ඉලක්ක කොට ගන්නේ යහපත් ගිහි ජීවිතයක්, යහපත් සමාජ ක්‍රමයක් සහ මිනිසුන් අතර යහපත් අන්තර් සංස්කෘතික සබඳතාවක් ගොඩනැගීම ය. ඒ සඳහා රූපවාහිනී මාධ්‍යය තුළ දේශනමය, සාකච්ඡාමය, සංගීතමය, නාට්‍යමය, විශේෂාංගමය සහ වාර්තාමය යනාදී විවිධ වැඩසටහන් වර්ග පැවතිය ද, ටෙලි නාට්‍ය වින්දනීය අන්තර්ගතයක් ඔස්සේ ප්‍රේක්ෂක ජන මනස ආමන්ත්‍රණය කරන බැවින්, එය යහපත් සමාජ ආකල්ප වෙත පොදු ජනයා නැඹුරු කරවීමෙහි ලා යෝග්‍ය වැඩසටහන් ආකෘතියකි. මෙහි දී නිර්මාණකරුවා සමකාලීන සමාජයෙහි ගොඩනැගෙන විෂමාදර්ශ මොනවා ද ඒවා කෙරෙහි පුද්ගල මැදිහත්වීම් කවරාකාර ද යන්න අධ්‍යයනය කොට එකී වස්තු විෂයන් හට බෞද්ධ දර්ශනයේ අන්තර්ගත උපදේශ මොනවා දැයි විමසා බලා වඩා තාර්කිකවත්, වින්දනාත්මක වටිනාකම් සහිතවත් සිය නිර්මාණ කාර්යය මෙහෙයවන බව පැහැදිලි විය. බෞද්ධ ගැමි ජන සමාජයේ කතන්දර කීමේ කලාව අතීතයේ සිට පැවති සම්ප්‍රදායක් විය. අසා රසවිඳීමේ ශෛලියෙන් නිර්මාණය වූ කතන්තර කලාව ක්‍රමිකව කියවා රස විඳීම, නරඹා රස විඳීම දක්වා ව්‍යාප්ත වන්නේ කලාවේ පරිණාමය හා තාක්ෂණයේ වර්ධනය සමග ය.

**නිගමන**

- පොහොය ටෙලි නාට්‍ය ධර්මය හා බැඳුණු පයීතයන්ට සීමා නොවී සමකාලීන සමාජ ප්‍රතිපදාවන් විෂය ගෝචර කරගෙන ඇත.
- සාම්ප්‍රදායික ධර්ම සන්නිවේදන කාර්යවල දී මුණගැසෙන්නේ බණ කතාවල චරිත, අවකාශ, ක්‍රියාකාරකම් හා බැඳුණු සංස්කෘතිය වුව ද පොහොය ටෙලි නාට්‍යවල දී එදිනෙදා සමාජයේ මුණගැසෙන චරිත, අවස්ථා, සිද්ධි දැකගත හැකි ය.
- ප්‍රේක්ෂකයාගේ දැනුම, අවබෝධය සහ මනෝභාවයන්ට සහසම්බන්ධිත අත්දැකීම් අවදි කොටගෙන සමකාලීන සංසිද්ධි මගින් අවබෝධතා ගොඩනංවා ගැනීමට අවකාශය ලැබීමෙන් ධනාත්මක සමාජ බලපෑමක් ඇති කළ හැකි ය.

- පොහොය නාට්‍ය මගින් පුද්ගලයාගේ සමකාලීන සමාජ ජීවිතය සංවේදී ලෙස පිළිබිඹු කර ඇති බැවින් එය පුද්ගල ආධ්‍යාත්මික සංවර්ධනය මූලික කොටගත් උපදේශ ලබා දෙන්නකට වඩා, යහපත් සමාජ චර්යා ගොඩනැගීමට උපදේශ සපයන වැඩසටහන් ආකෘතියක් බැව් තහවුරු වේ.
- පවුල් සබඳතා හා සමාජ බැඳියාවන් නොනැසී, නොබිඳී පවත්වාගෙන යාමෙහි ලා වන සමාජ වගකීම ද පොහොය ටෙලි නාට්‍යවලින් අවධාරණය කෙරේ.
- වෘත්තාන්ත ආගමික චිත්‍රපට මෙන් නොව පොහොය ටෙලි නාට්‍ය හා ටෙලි චිත්‍රපට අද්‍යතන සමාජය, යටි පෙළ කියැවීමකට සහ කැඩපත්කරණයට පාත්‍ර කරයි.

**ප්‍රමුඛ පද** - ආගමික සන්නිවේදනය, ජාතික රූපවාහිනිය, පොහොය ටෙලි නාට්‍ය, ස්වාධීන රූපවාහිනී සේවය, සුචරිතවාදී සමාජය

## ආශ්‍රිත ග්‍රන්ථ

ඉනාමළුවේ ශ්‍රී සුමංගල හිමි. (2020). *ධර්ම සන්නිවේදනයේ ගුවන්විදුලි භූමිකාව*. ගුවන්විදුලි සමීක්ෂා. තෙවන කලාපය. 111-115

ගුණසිංහ, ඒ. (2025). *බෞද්ධ සන්නිවේදනයේ විශේෂ ලක්ෂණ*. බුදු මග ධර්ම සංග්‍රහය.

බෝගමුව, සී. (2014). *ටෙලි නාට්‍යයේ ප්‍රමිතිය කුමක් ද?*. *රූපවාහිනී සමීක්ෂා*. අටවන කලාපය. 105-110